RARE

# ග්‍රාමීය දේවාල ආශ්‍රිතව පවත්නා අභිචාර විධි, සිරිත්විරිත්වල සන්නිවේදන ලක්ෂණ

## (ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දේවාල ආශ්‍රිතව සිදු කෙරෙන අං කෙළිය ඇසුරින්)

ඉදිරිපත් කරනු ලබන්නේ

එම්.එච්.එස්. මෙන්ඩිස්

FGS/MACO/MC/11/005


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1273 |
| වර්ග අංකය: | |


සාමාජීය විද්‍යාපති ජනසන්නිවේදනය උපාධියෙහි අවශ්‍යතාවක් පූරණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

2016 ජනවාරි

# නිබන්ධ සාරාංශය

"ග්‍රාමීය දේවාල ආශ්‍රිතව පවත්නා අභිචාරවිධි, සිරිත්විරිත්වල සන්නිවේදන ලක්ෂණ" යන මාතෘකාව යටතේ ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රිතව පවත්නා අං කෙළිය නම් පූජාකර්මය ඔස්සේ පර්යේෂණය සිදුකරන ලදී. මීට ඇතුළත්ව අං කෙළිය පමණක් නොව පොදුවේ දේව ඇදහීම සහ ඒ ආශ්‍රිතව ජනතාව තුළ ඇති පුදපූජා විශ්වාසයන් පිළිබඳවද සාකච්ඡාවට බඳුන් කෙරේ. බටහිර හා හින්දු දේව ඇදහීම සඳහා දෙවියන් පිළිබඳව නිර්මාණය කර ඇති කතාන්දර මෙන්ම දේව රූපවලින් සන්නිවේදනය වන ඒ ඒ දෙවියන් සතු හැකියාවන්, බලයන් පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කිරීමට උත්සාහ ගන්නා ලදී.

තිඹිරිගහ කෝවිල පිළිබඳ තොරතුරු රැස් කිරීමත්, එහි පැවැත්වෙන පුදපූජාදිය පිළිබඳවත් රැස් කළ තොරතුරු විශ්ලේෂණය සඳහා පාදක කර ගන්නා ලදී. අතීත මතකයන් ඉතිරිව ඇති පුද්ගලයන් සොයා ගොස් ඔවුගෙන් දත්ත රැස් කර ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා, සිද්ධි අධ්‍යයනය, අන්තර්ගත විශ්ලේෂණය ප්‍රධාන වශයෙන් දත්ත රැස් කිරීමට යොදාගත් ක්‍රමයන් වේ. අං කෙළියේ දී පූජාවට පාත්‍රවන පත්තිනි දේව ඇදහිල්ල ද පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදී. පත්තිනි උත්පත්ති කතාවත්, අං කෙළියේ උත්පත්ති කතාවත් ඉදිරිපත් කර තිබේ. කෝවිල පිළිබඳ ඇති ජනප්‍රවාදයන් දක්වා, දඩල්ල ගම්මානයේ සාමාජීය තත්ත්වය පිළිබඳ ඇති තොරතුරු මත සන්නිවේදන සිද්ධාන්ත සමඟ සංසන්දනාත්මක විග්‍රහයක් ඉදිරිපත් කිරීමට උත්සාහ කරන ලදී. සන්නිවේදන මූලධර්ම, සමාජ සන්නිවේදන ලක්ෂණ, සංවර්ධනාත්මක සන්නිවේදන ලක්ෂණ, සංස්කෘතික සන්නිවේදන ලක්ෂණ, නිර්මාණාත්මක සන්නිවේදන ලක්ෂණ යන සන්නිවේදන සිද්ධාන්ත ඔස්සේ දත්ත විශ්ලේෂණය සිදු කර තිබේ. ඒ අනුව සන්නිවේදන සිද්ධාන්ත බොහෝමයක් ඇතුළත්ව දියුණු සංදේශන ක්‍රියාවලියක් අං කෙළියෙහි අන්තර්ගත බව හඳුනාගත හැකි විය.

සශ්‍රීකත්වය යනු අතීතයේ සංවර්ධනය හැඳින්වීම සඳහා භාවිත කළ පදයකි. ඒ අනුව අං කෙළිය ග්‍රාමීය සංවර්ධනය උදෙසා සිදුකළ සංවර්ධනාත්මක සංදේශනයකි. වර්තමානයේ මුළු ලෝකයම කතාබහ කරන තිරසාර සන්නිවේදනය යන සංකල්පය අං කෙළියේ අන්තර්ගත බව පර්යේෂණයෙන් අනාවරණය වේ. ජාතික සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි ජනතා විශ්වාසය දිනා ගැනීම සඳහා ඉතාමත් යෝග්‍ය ලෙස අං කෙළිය වැනි සාම්ප්‍රදායික මාධ්‍යයක් යොදාගත හැකි ය. මේ සියල්ලටම හේතුව වන්නේ ගැමියා පරිසරයට දක්වන දැඩි භක්තියත්, ගෞරවයත් සහ පරිසරය පිදීම සඳහා පාරිසරික වස්තූන්ට දේවත්වයක් ආරෝපණය කොට ගෙන තිබීම ය.

අං කෙළිය, තිඹිරිගහ කෝවිල, දඩල්ල, පත්තිනි දේවියන්, අං ඇදීම

# Abstract

This research titled "Characteristics of customs and traditions related to communication in rural devalas" was carried out by exploring the rituals of "Ang Keliya" and associated beliefs in gods in the area of Kadawath Sathara provincial secretarial division in Galle. The concept of god evolved with human evolution and its study is traditionally done by the study of related works of historical literature. An attempt was made to describe the abilities and the strengths of various gods was communicated in stories and the images of gods.

"Ang Keliya" is not presently practiced. Information was gathered by studying the history of Thimbirigaha kovil and associated retuals, from the elder citizens of the area. Information gathering proved difficult due to persons with the knowledge being no longer alive. Interviews, case studies and content analysis were the tools of data collection and analysis.

"Paththini" goddess rituals, "Paththini" genesis and "Ang Keliya" genesis were used to relate folklore to the social status of Dadella villagers employing communication theory. Communication element, social forms of communication, characteristics of developing communication, features of cultural communication, creative communication elements were employed for analysis.

The study findings reveal that "Ang Keliya" depicts advanced features of communication. Fertility is synonymous with development and "Ang Keliya" is a fertility ritual conveying rural development. The currently popular concept of sustainable communication is clearly noted in "Ang Keliya". This raises the possibility of using ancient customs like "Ang Keliya" to communicate with the society on modern development efforts. The love, honour and devotion of rural villagers to nature would be the basis of such successful communication.


**Ang keliya, Paththini, Thibirigaha kovila, Dadalle, Ang adeema**